# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CSS/7/5/6/1 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2015.07.10 |

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 06 - 2015

දකුණු පළාත් සභාවේ
සියළුම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත

**<u>රාජ්‍ය ආයතන සඳහා සාමාන්‍ය රක්ෂණ ආවරණයන් සැලසීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය විසින් නිකුත්කර ඇති 2015.06.29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක : 01/2015 හි පිටපතක් මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම චක්‍රලේඛයට අනුව, සියළුම රාජ්‍ය ආයතන හා අර්ධ රාජ්‍ය ආයතන තම ආයතනයට අවශ්‍ය වන රක්ෂණ ආවරණයන් සලසා ගැනීමේදී ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති වෙළඳපොල තුල ක්‍රියාත්මක වන රක්ෂණ සේවාවන් සපයන ආයතනයන් වෙතින් පමණක් තරඟකාරී ලෙස මිල ගණන් කැඳවීම යටතේ සෘජුවම රක්ෂණ පහසුකම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. මෙම රක්ෂණ සේවා ලබා ගැනීමේදී රක්ෂණ නියෝජිතයන්ගේ ආධාරය ලබා නොගත යුතුය.

03. ආයතන ප්‍රධානීන් විසින් තම ආයතනයට අවශ්‍ය රක්ෂණ සේවාව ලබා ගැනීමේදී, ඒ සඳහා දැරීමට සිදුවන පිරිවැය හා ලබාගන්නා සේවාවේ ගුණාත්මකභාවය මෙන්ම එම සේවාව ලබා ගැනීමට තම ආයතනයට ඇති පහසුව සලකා සිය ආයතනයට වඩා වාසිදායක වන අයුරින් තරඟකාරී ලෙස රක්ෂණ ආයතනය තෝරාගැනීමට වගබලා ගත යුතුය.

04. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් තරඟකාරී මිළ ගණන් කැඳවීම අනුව දැනට රාජ්‍ය ආයතන විසින් රක්ෂණ සේවාවන් ලබා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කරමින් නිකුත්කර ඇති එම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුගමනය කරන ලෙසත්, ඒ සම්බන්ධයෙන්




ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office: 091 2234052, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின்-அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம்: / Web site: www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස් එච්.දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.



“විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්”

ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව යටතේ ඇති සියළුම කාර්යාල දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත් කාරුණිකව දන්වමි.

ඩබ්ලිව්.කේ.කේ. අතුකෝරල
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් :

1. ලේකම්, මුදල් අමාත්‍යාංශය - දැ.ගැ.ස.
2. සහකාර විගණකාධිපති, දකුණු පළාත - දැ.ගැ.ස.
3. සභා ලේකම්, දකුණු පළාත් සභාව - දැ.ගැ.ස.
4. ද.ප. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - දැ.ගැ.ස.